www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගැඹුරු වන අවපාතයේ සංඥා මධ්‍යයේ වෙළඳපොලවල් සහ ලාභ ඉහල නගී

**Markets, profits soar amid signs of deepening slump**

**2010 අගෝස්තු 03**

ආර්ථික වර්ධනය වේගය අඩුවෙමින් පවතිනා බවට ඇඟවෙන සංඥා මධ්‍යයේ පවා ප්‍රධාන බැංකු සහ සංගත ලාභ පිම් වාර්තා කරන තතු යටතේ ආසියාවේ, යුරෝපයේ සහ එක්සත් ජනපදයේ කොටස් වෙළඳපොලවල් සඳුදා තියුනු ලෙස ඉහල නැගුනි. යුරෝපා මහාද්වීපයේ විශාලතම බැංකුව වන එච්එස්බීසී සහ ප්‍රන්සයේ විශාලතම නය දෙන්නා වන බීඑන්පී පැරිබාස් අපේක්ෂා කලාට වඩා වැඩි ආදායම් වාර්තා කල තතු යටතේ ඒවායේ කොටස් මිල මාස තුනක් තුල ඉහල ම අගයන් වාර්තා කලේ ය. ආකර දැවැන්තයන් වන බීඑච්පී බිලිටන් සහ රියෝ ටින්ටෝහි කොටස් අගයන් ද ඉහල නැගුනි.

එක්සත් ජනපදයේ ඩව් දර්ශකය ඒකක 208කින් හෙවත් සියයට 1.99කින් ඉහල ගිය අතර අනෙකුත් ප්‍රධාන මිල දර්ශක ද ඒ හා සමාන ඉහල නැගීම් වාර්තා කලේ ය. 2009 වසරේ හතරවන කාර්තුවේ සියයට 5.0ක් වූ එක්සත් ජනපද දල දේශීය නිෂ්පාදිතයේ (දදේනි) වර්ධනය මේ වසරේ පලමු කාර්තුවේදී සියයට 3.7ක් දක්වා ද දෙවන කාර්තුවේ දී සියයට 2.4 දක්වා පල්ලම් බැසීයැයි වානිජ දෙපාර්තමේන්තුව පසුගිය සිකුරාදා වාර්තා කර තිබිය දී ත් මෙම කොටස් අගයයන්හි ඉහල නැගීම් සිදු විය. ජූලි මාසය තුල එක්සත් ජනපද නිෂ්පාදන ක්‍රියාකාරීත්වයේ පහල වැටීමක් සිදු වී ඇතැයි සඳුදා නිකුත් කල වාර්තාවකින් අවර ආර්ථිකයක් පිලිබඳ ප්‍රවෘත්තිය සවිබල ගැන්වුනි.

ඉදිරි මාස 18 තුල ලෝකය පුරා වඩාත් අඩුවන ආර්ථික වර්ධනයක් සිදු වෙතැයි ජූලි මාසය මුල දී පුරෝකථනය කල ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) එක්සත් ජනපදය ද යුරෝපයේ, ආසියාවේ සහ ලතින් ඇමරිකාවේ ප්‍රධාන ආර්ථිකයන් ද පිලිබඳ 2011 වසර සඳහා වන එහි පූර්ව තක්සේරු කිරීම් යටි අතට සංශෝධනය කලේ ය.

රැකියා වියුක්තිය අවපාතයකට ආසන්න මට්ටමේ එලැඹෙන මාස ගනනාවක් තුල හෝ වසර ගනනාවක් තුල පවා පවතිනු ඇතැයි එවන් දුබල වර්ධන අනුපාතයන් මගින් සහතික කෙරේ. මේ වනවිට ක්ෂනිකව එලැඹෙන කාලයේ රැකියා අර්බුදයේ සැලකියයුතු ලිහිල් වීමක් සිදුවනු නැතැයි යන්න ප්‍රකාශ කිරීම එක්සත් ජනපද නිලධාරීන් ගේ පුරුද්දක් බවට පත් වී තිබේ.

යුරෝපයේ සෑම ආන්ඩුවක් ම පාහේ දරුනු කප්පාදු පියවර පටවමින්, රැකියා සහ වැටුප් කපමින්, පරිභෝජනය මත බදු පනවමින් සහ සමාජ වැඩපිලිවෙලවල් කපාහරිමින් සිටී. එක්සත් ජනපදය තුල ඔබාමා පරිපාලනය සිය මසුරු උත්තේජන ආරම්භකත්වයන් පවා අත්හැර දමා ඇත. රැකියා වියුක්තිය පහලට ගෙන ඒමට හෝ මාස හයකට වැඩියෙන් රැකියා විරහිතව සිටින ආසන්න වසයෙන් මිලියන 7ක් වන අයද ඇතුලත්ව රැකියා විරහිත සහ ඌන රැකියාවල නියුක්ත මිලියන 26 ක් සඳහා සහන සම්පාදනය කිරීමට එය කිසිවක් යෝජනා නො කරයි. ඒ වෙනුවට එය පොරොන්දු දෙමින් සිටින්නේ මූලික සමාජ සුභසාධන කප්පාදු කිරීමට යි.

අලෙවිය සහ ආදායම් එකතැන පල්වීමේ හෝ බිඳ වැටීමේ කොන්දේසි යටතේ පවා වැටුප් පහත හෙලීමට, ඵලදායිතාව වැඩි කිරීමට සහ සංගත ලාභ පිම්බීමට ගෙනයන ජාත්‍යන්තර ධනේශ්වරයේ මෙම දැනුවත් පිලිවෙතෙහි ප්‍රතිඵලයන් මූල්‍ය වෙළඳපොලවල් විසින් සඳුදා සැමරී ය.

යුරෝපය තුල ක්‍රියාත්මක වන ස්ටොක්ස් 600 දර්ශකයේ සමාගම්වලින් සියයට 60ක් පමන ආදායම් විශ්ලේෂකයන්ගේ ප්‍රක්ෂේපනයන් ඉක්මවා යන ආදායම් ජූලි 12 පටන් ලබා ඇතැයි වාර්තා වී තිබේ. එක්සත් ජනපදය තුල ස්ටෑන්ඩර්ඩ් සහ පුවර් 500 දර්ශකයේ සමාගම්වලින් සියයට 70ක් සිය ආදායම් සහ ලාභ වසරකට පෙර පැවති මට්ටම්වලට වඩා සියයට 42කින් වැඩි බව වාර්තා කරන්නේ අලෙවිය සියයට 9කින් පමනක් ඉහල නැගුනු තතු යටතේය.

පොලී අනුපාත ශූන්‍යයට ආසන්න මට්ටමේ තබාගනිමින් ෆෙඩරල් රිසර්ව් බැංකුව විසින් වෝල් වීදියට තථ්‍ය නිදහස් නය නිකුත් කිරීම තව දුරටත් කරගෙන යන බවට ෆෙඩරල් සභාපති බෙන් බර්නාන්කේගේ සඳුදා කල කතාවක දී ප්‍රකාශ කල සැඳහුම් මගින් බැංකු සහ මහා ආයෝජකයින්ව වැඩිදුර දිරිමත් කරන ලදී. ඒ අතර ම අවිනිශ්චිත කාලසීමාවක් සඳහා විරැකියාව ඉතා ඉහල මට්ටමක රැඳී තිබෙනු

ඇතැයි කී ඔහු විරැකියා අනුපාතය පහලට ගෙන ඒමට ෆෙඩරල් බැංකුවට සැලසුම් නැති බවට ඉඟි කලේ ය.

එදින ම රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක පෙනී සිටි ජනාධිපති ඔබාමා සිය ආර්ථික පිලිවෙත්වල සාර්ථකත්වය යයි කියන දෙය ගැන කටමැත දොඩමින් එක්සත් ජනපදය සම්පූර්න ප්‍රකෘතියට පත්වීමේ ගමනේ "අඩ දුරක්" ගෙවා ඇතැයි ප්‍රකාශ කලේ ය. මෙසේ ප්‍රකාශ කරන්නේ 2009 වර්ෂය තුල සෑම ඇමරිකානුවන් පස් දෙනෙකුගෙන් එක් අයෙක් ම සියයට 25 ට හෝ ඊට වැඩි ආදායම් අහිමි වීමකින් පීඩා විඳින තතු තුල හා පවුල් මිලියනයකට වැඩි ප්‍රමානයක් උගසට සින්න වීම නිසා සිය නිවාස අහිමි කරගන්නා තතු යටතේය. මීට අමතරව මිලියන 1.4ක් ජනයා සති 99ක් හෝ ඊට වැඩියෙන් රැකියා වියුක්තව සිටින අතර මුදල් ආදායම් නොමැතිව සිටින ඔවුන්ට ලැබෙන සියලු ප්‍රතිලාභ මේ වන විට හිඳී ගොස් ඇත.

සති අන්තය පුරා පැවති ග්‍රීක ට්‍රක්රථ රියැදුරන්ගේ වර්ජනය බිඳ දැමීම සඳහා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුව සාර්ථක ලෙස මිලිටරිය යොදා ගැනීම නිසා ද මූල්‍ය වෙලඳපොලවල් නිසැකව ම ඉපිලෙන්නට ඇත.

ආර්ථක විද්‍යාඥ සහ *නිව් යෝක් ටයිම්ස්* තීරු ලිපි රචක පෝල් ක්‍රෑග්මන් පාලක ප්‍රභූවේ පන්ති යුද මූලෝපාය පිලිබඳව අවංකව ලිවී ය. "වරෙක සිතාගත නො හැකි වූ ආර්ථක අතෘප්තියේ මට්ටමක් නව සාමාන්‍යය බවට පත්වෙමින් තිබේ ය යන්න අපගේ පාලක ප්‍රභූව සරලව ම ගනනට නො ගන්නා බවට වැඩෙන සාක්ෂි තිබේ" යයි ඔහු අවධානයට ලක් කලේ ය.

"බලයේ සිටින්නෝ ක්ෂනිකව ඉහල විරැකියාව ආර්ථික භූ දර්ශනයේ 'ව්‍යුහාත්මක' ස්ථිර කොටසක් බව ප්‍රකාශ කරනු ඇත ..." යයි ඔහු යෝජනා කලේ ය. "තවත් වසර දෙකකින් විරැකියාව අතිශයින් ඉහල මට්ටමකට නගිනු ඇති අතර නිසැකව ම එය දැනට වඩා වැඩි අගයක් වනු ඇත..." යයි පුරෝකථනය කිරීම දක්වා ඔහු ඉදිරියට ගියේ ය.

මේ දක්වා එවැනි පිලිවෙතක් පැටවීමට ධනේශ්වරයට උපකාරී වී ඇත්තේ වෘත්තීය සමිතිවල ද්‍රෝහීත්වය සහ අපරාධකාරීත්වය යි. යුරෝපය තුල මධ්‍යම පන්තික "වාම" කන්ඩායම් අතර සිටින සිය සහචරයන්ගේ දේශපාලනික ආධාරය ලබන වෘත්තීය සමිති විශේෂයෙන් ම ග්‍රීසිය, ස්පාඤ්ඤය, පෘතුගාලය සහ ප්‍රන්සයේ දී කප්පාදු පියවරවලට එරෙහි මහජන කම්කරු පන්තික විරුද්ධත්වය පාලනය කිරීමට සහ විසුරුවා හැරීමට කටයුතු කොට ඇත. විරුද්ධත්වය සංකේත වර්ජන සහ විරෝධතාවන්ට සීමා කර ඇති ඔවුහු ජාත්‍යන්තර බැංකු සහ මූල්‍ය වෙලඳපොලවල් විසින් අනවනු ලබන කප්පාදු පියවර පැටවීමට සිය අනුගාමී ආන්ඩු සමග සහයෝගී වී ඇත.

එක්සත් ජනපදය තුල ඒඑෆ්එල්-සීඅයිඕ සහ ප්‍රතිමල්ලව චේන්ජ්-ටු-වින් වෘත්තීය සමිති සම්මේලනය දේශපාලන දර්ශන පථය මත පලුද්දක් ඇති කරන්නේ ම නැති තරම් ය. කිසිවක් යෝජනා නො කරන සහ කිසිවක් සංවිධානය නො කරන ඔවුහු ඔබාමා පරිපාලනයට දේශපාලන ආවරනයක් සම්පාදනය කිරීමටත් කම්කරු පන්තියේ කෝපය ආර්ථික ජාතිකවාදයේ ප්‍රතිගාමී නාලිකා ඔස්සේ අපසරනය කිරීමටත් පේවී සිටිති.

පසුගිය සතියේ ඩිට්‍රොයිට්හි මෝටර් රථ කම්හල් දෙකක ඔබාමා පෙනී සිටි අවස්ථාවේ එක්සත් මෝටර් කම්කරු සමිතිය ඔහු මාහැඟි වස්තුවක් ලෙස ප්‍රදර්ශනය කිරීමට දැරූ උත්සාහයත් සමග ඇමරිකානු වෘත්තීය සමිතිවල භූමිකාව සම්පින්ඩනය කෙරින. පිලිකුල් සහගත දර්ශනයක් පෙන්නුම් කරමින් සිය ජෙනරල් මෝටර්ස් සහ ක්‍රයිස්ලර් ඇප බැඳීම මගින් එක්සත් ජනපද මෝටර් රථ කර්මාන්තය "බේරාගැනීම" ගැන මැත දෙඩූ ඔබාමා එසේ කලේ අලුතින් කුලියට ගන්නා කම්කරුවන්ගේ වැටුප පැරනි කම්කරුවන්ගේ වැටුපෙන් අඩකට එනම් ඩොලර් 14 දක්වා කප්පාදු කිරීම, කම්හල් වසා දැමීම, මොටර් රථ සම්බන්ධ රැකියා දස දහස් ගනනක් කපා දැමීම සහ විශ්‍රාමලත් කම්කරුවන්ගේ සෞඛ්‍ය ප්‍රතිලාභ කපා දැමීම වැනි දෑ ක්‍රියාත්මක කිරීමේදී සිය මෝටර් රථ කාර්යසාධක බලකායේ භූමිකාව නො තකා හරිමිනි.

2008 සැප්තැම්බර් මූල්‍ය ද්‍රවීකරනයෙන් දෙවසරක් ගතව ඇති තැන ආන්ඩුවේ පිලිවෙත් මත වෙන කවරදාටත් වඩා දැඩි ග්‍රහනයක් බැංකු විසින් පවත්වාගෙන යයි. කම්කරු පන්තිය වෘත්තීය සමිති නිලධරයෙන් බිඳී මූල්‍ය සංගත කතිපයාධිකාරයට සහ එහි දේශපාලන ආවතේවකරුවන්ට එරෙහි පුලුල් කාර්මික සහ දේශපාලනික අරගලයක් කරන තුරු ඔවුහු කම්කරුවන්ගේ වැටුප් සහ ජීවන කොන්දේසි විනාශ කිරීමට මහා පරිමාන විරැකියාව පාවිච්චි කරනු ඇත.

ඒ සඳහා සියල්ලන්ට රැකියා සපයන යෝධ මහජන වැඩ වැඩපිලිවෙලක් සහ කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ බැංකු සහ ප්‍රධාන සංගත ජනසතු කිරීම කැඳවුම් කරන සමාජවාදී ක්‍රියාමාර්ගයක් අවශ්‍ය වේ.

බැරී ග්‍රේ

© www.wsws.org